203064A
2013

# ආලන්ති අම්මාවරුන්ගේ සමාජ භූමිකාව පිළිබඳ අධ්‍යයනයක්

08 NOV 2011

එච්.පී නිරෝෂා සුරංගනී

භාෂා හා සංස්කෘතික අධ්‍යනාංශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

Libary - USJP
203064

දර්ශනපති 2010

203064

# ආලත්ති අම්මාවරුන්ගේ සමාජ භූමිකාව පිළිබඳ අධ්‍යයනයක්

එච්.පී නිරෝෂා සුරංගනී

GS/MA/CS/3034/07

භාෂා හා සංස්කෘතික අධ්‍යනාංශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනපති උපාධි පරීක්ෂණය සඳහා

භාෂා හා සංස්කෘතික අධ්‍යනාංශය යටතේ ඉදිරිපත් කරනු ලබන

ස්වාධීන නිබන්ධනය

2010-10-11

## අපේක්ෂකයාගේ ප්‍රකාශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි පීඨයේ අංක පීඑස්/එම්.ඒ/සීඑස්/3034/07 යටතේ ලියාපදිංචි හේවා ගජනායකගේ නිරෝෂා සුරංගනී වන මා විසින් ඉදිරිපත් කරනු ලබන ආලත්ති අම්මාවරුන්ගේ සමාජ භූමිකාව නම් වූ මෙම නිබන්ධනය මහාචාර්ය බණ්ඩාරමැණිකේ විජේතුංග මහත්මියගේ උපදේශකත්වය යටතේ සිදු කළ බවත්, එහි අන්තර්ගතය සම්පූර්ණයෙන්ම හෝ කොටස් වශයෙන් කවර විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් සඳහා ඉදිරිපත් නොකළ බවට ප්‍රකාශ කරමි.

2011.11.04 ............................      Nirosha ............................

දිනය      අත්සන

## උපදේශක තුමියගේ ප්‍රකාශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි පීඨයේ අංක පීඑස්/එම්.ඒ/සීඑස්/3034/07 යටතේ ලියාපදිංචි ශේවා ගජනායකගේ නිරෝෂා සුරංගනී මිය යට කී ප්‍රකාශය සත්‍ය බවත්, මෙම නිබන්ධනය මෙම විශ්වවිද්‍යාලයේ දර්ශනපති උපාධිය සඳහා ඇගයීමට සුදුසු බවත් නිර්දේශ කරමි.

2011-11-04 ........................

දිනය

........................

අත්සන

උපදේශක ගුරුතුමියගේ නම:- මහාචාර්ය. බී. එම්. විජේරත්න.

# පටුන


| | | |
|---|---|---|
| අයදුම්කරුගේ ප්‍රකාශය | | i |
| උපදේශක තුමියගේ ප්‍රකාශය | | ii |
| පටුන | | iii-iv |
| පිදුම | | v |
| ස්තුතිය | | vi-viii |
| හැඳින්වීම | | ix |
| අධ්‍යයනයේ අරමුණ හා වැදගත්කම | | x |
| අධ්‍යයන සීමාව | | x |
| අධ්‍යයන ක්‍රමවේදවය | | xi |
| අධ්‍යයන සැලැස්ම | | xii-xiii |
| පළමු වැනි පරිච්ඡේදය | | 1 |
| 1. | ආලත්ති යන වචනය පිළිබඳ නිර්වචන | 2-5 |
| දෙවැනි පරිච්ඡේදය | | 6 |
| 2. | දේව සංකල්පය, දේවදාසින් හා ආලත්ති අම්මාවරු | |
| 2.1 | දේව සංකල්පයේ ආරම්භය | 7-11 |
| 2.2 | දේව සංකල්පයේ බෞද්ධ පසුබිම | 12-14 |
| 2.3 | දේව සංකල්පය හා දේවදාසීන් | |
| 2.3.1 | දේවදාසීන් (හැඳින්වීම) | 15-20 |
| 2.3.2 | පෞරාණික හා මධ්‍යකාලීන ඉතිහාසය | 21-32 |
| 2.3.3 | වර්තමාන තත්ත්වය | 33-44 |

තෙවැනි පරිච්ඡේදය 45

3. දේශීය දේවාල සංස්කෘතිය හා ආලත්ති අම්මාවරු

3.1 කතරගම දේවාලය හා ආලත්ති අම්මාවරු 46-69

3.2 දළදා මාලිගාව හා ආලත්ති අම්මාවරු 69-81

3.3 සබරගමුව මහ සමන් දේවාලය හා ආලත්ති අම්මාවරු 82-108

3.4 සොරගුණේ දේවාලය හා ආලත්ති අම්මාවරු 109-119

සිව් වැනි පරිච්ඡේදය 120

4. ආලත්ති අම්මාවරුන්ගේ සමාජ භූමිකාව 121-129

පස් වැනි පරිච්ඡේදය 130

5. සමාලෝචනය 131-132

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 133-138

සූචිය 139-146

ඡායාරූපාවලිය 147-154

# පිදුම

ආදරයේ උල්පත වූ

අදටත් අප වෙනුවෙන්

නෙතු දල්වා බලා සිටින

මාගේ ආදරණීය

අම්මාට සහ තාත්තාට

සෙනෙහසිනි....

# ස්තුතිය

පසුගිය වසර කිහිපය මාගේ ජීවිතයේ වෙනස්කම් සිදුවූ වසර කිහිපයකි. නමුත් මේ සෑම අවස්ථාවකම වාගේ මගේ හිත යට යමක් තිබෙන බව මට හැඟුනි. විටෙක එය හිතට බරක් විය. ඇත්තෙන්ම එය කෙසේනම් මෙම ගවේෂණයට යොමු වනවාද යන්නයි. එනිසාවෙන්ම යම් අවස්ථාවල යම් යම් දේ මග හැරුනා දැයි මට සිතේ. නමුත් අවසානයේ එම බාධක පරයා ප්‍රතිඵලදායක ඉසව්වක් කරා පැමිණීමට හැකි විය. නැවත හැරී බලන විට මාගේ උත්සහය පමණක් නොව එය පසු පස බොහෝ දෙනෙකුගේ උපකාරයයන් ගොනුව තිබුණි. ඇත්තෙන්ම මා ලබන සතුට ඔවුන් ඉදිරියේ පැසසිය යුතු ය. එසේ පැසසීමට ඔවුන් සුදුස්සෝ වෙති.

පර්යේෂණ ලෝකයේ මුල් පියවර තබන අවස්ථාවේ පර්යේෂණ ගැටළුවක් සකස් කර ගැනීමේ දුෂ්කර සිතුවිල්ලේ පසුවන විට මා මෙම පර්යේෂණය කරා යොමු කළ මහාචාර්ය තිස්ස කාරියවසම් සූරීන්ට මාගේ ගෞරව ප්‍රණාම ස්තුතිය පුද කර සිටිමි. එමෙන්ම මාගේ මාතෘකාව අනුමත කරමින්, එහි වැදගත්කම අවධාරනය කළ මහාචාර්ය ඥාණදාස පෙරේරා සූරින්ද ගෞරව බහුමානයෙන් යුතුව සිහිපත් කරමි. පර්යේෂණ නිබන්ධනයේ ආරම්භයේ සිට අවසානය දක්වා එය නිවැරදි කරමින්, නව ඉසව්වක් කරා යොමු කරමින්, මා ධෛර්‍යයමත් කළ මාගේ උපදේශක තුමිය වන මහාචාර්ය බණ්ඩාරමැණිකේ විජේතුංග ගුරුමෑණියන් බැති සිතින් සිහිපත් කරමි.

විද්‍යදය පියසේ පා පහස තැබූ දින සිට කවදත් දයාබරිතව ඔහුගේම දරුවන් ලෙස අපදෙස බැලූ සංස්කෘති අධ්‍යයන අංශයේ අංශ ප්‍රධාන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ ගුරු පියාණන් දයාබරිතව සිහිපත් කිරීම සිදු කළ යුත්තකි.

එමෙන්ම පළමු සම්මන්ත්‍රණ පත්‍රිකාව ඉදිරිපත් කරන අවස්තාවේ සිට මාගේ පරීක්ෂක ලෙස කටයුතු කරමින්, ඒ අවස්ථාවේ උපදෙස්වලට පමණක් සීමා නොවී ඔහුගේ පෞද්ගලික පුස්තකාලය පවා විවරකර දී මාව දිරිමත් කළ සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ලයනල් බෙන්තරගේ මැතිඳුන් ස්තුති පූර්වකව සිහිපත් කරමි. එසේම උසස් අධ්‍යාපනයේ කඩඉම් විවර කර දුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භාෂා හා සංස්කෘතික අධ්‍යයන අංශයේ සියලුම ආචාර්ය මණ්ඩලය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

මාගේ අධ්‍යයනයට තෝතැන්නක් වූ කතරගම පුද බිම එමෙන්ම එහි ශ්‍රද්ධා සිතින් තේවාවන්හි යෙදෙන කතරගම මහා දේවාලයේ ප්‍රධාන කපු ධුරන්ධර සොම්පාල රත්නායක මැතිඳුන් ඇතුළු කපු මඩුල්ලත්, ලංකාවේ පමණක් නොව ඉන්දියවේ දේවාල පිළිබඳව ද සංසන්දනාත්මක විග්‍රහයක් ලබා දුන් කතරගම වල්ලිඅම්මා දේවාලයේ කපු මහතාත්, විශේෂයෙන්ම මාගේ කෘතිය සශ්‍රික කිරීමෙහිලා මහත් දායකත්වයක් ලබා දුන් කතරගම දේවාලයේ සියලුම ආලත්ති අම්මාවරුනුත් ඉතාම ගෞරවයෙන් යුතුව සිහිපත් කරමි.

දළදා මාලිගාවේ සුදු වතින් සැරසුනු, බොහෝ ලෙන්ගතුව තොරතුරු පමණක් නොව මාලිගාවේ ඔබ මොබ පෙන්වමින් උදව් කළ අආලත්ති අම්මාවරුන් දෙදෙනා මෙන්ම දළදා මාලිගාවේ පුස්තකාලයාධිපති තුමන් ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයට මාගේ හදපිරි ස්තුතිය හිමිවේ.

එමෙන්ම සබරගමුව මහ සමන් දේවාලයේ ප්‍රධාන කපු මහත්වරුන් වන ශ්‍රී නාරායන හා විජයනාරායන මහත්වරුන් දෙදෙනාට ද එහි මාධ්‍යම සම්බන්ධීකාරක ලෙස කටයුතු කරන සෝමසිරි හබරගමුව මහතාද, එහි සේවය කරන අආලත්ති අම්මාවරුන් හතර දෙනා ද ගෞරව පූර්වකව සිහිපත් කරමි.

එමෙන්ම සොරගුණේ දේවාලයේ ඉතිහාසය, එහි ක්‍රියාකාරීත්වය විස්තර කොට පොත්පත් ආදිය පවා සපයා දුන් සොරගුණේ විහාරධිපති සොරගුණේ පඤ්ඤානන්ද හිමියන් ද ගෞරව සම්ප්‍රයුක්තව සිහිපත් කරමි. එමෙන්ම සොරගුණේ දේවාලයේ මොහොට්ටාල ලෙස සේවය කරන ඒ.එල්.එම් කීර්තිරත්න බණ්ඩාර මහතා ද, අආලත්ති අම්මාවරුන් ද ස්තුති පූර්වකව සිහිපත් කරමි.

තොරතුරු සොයා යෑමේ පරිශ්‍රමයේදී මා හට අත්වැලක් වූ කොළඹ පුස්තකාල සේවා මන්ඩලයේ පුස්තකාලයාධිපති, කාර්ය මණ්ඩලයත්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පුස්තකාලයේ පුස්තකාලයාධිපති තුමා ඇතුළු කාර්ය මණ්ඩලයත්, සෞන්දර්ය අධ්‍යාපන ආයතනයේ පුස්තකාලයාධිපති තුමා, කොළඹ මහජන පුස්තකාලයේ පුස්තකාලයාධිපති තුමා ඇතුළු කාර්ය මණ්ඩලයත්, ශබ්දකෝෂ කාර්යාලයේ සියලුම කාර්ය මණ්ඩලයත්, ජාතික ලේඛනාරක්‍ෂක දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයත් ස්තුති පූර්වකව සිහිපත් කරමි.

මාගේ පර්යේෂණ කෘතිය වර්ණවත් කරමින් අදාළවන්නා වූ ඡායාරූප එම ස්ථානවලට ගොස් ලබා දෙමින් මට සහයෝගය දුන් වැලිමඩ සිංහ ස්ටූඩියෝ හි අධිපති මනෝජ් සේරසිංහ මහතාටත්, දයාබරිතව ස්තුතිය පුද කරමි.

එමෙන්ම දිවා රාත්‍රී වෙහෙසෙමින් මාගේ පර්යේෂණ නිබන්ධනය පරිගණක ගතකර දුන් සමන් කුමාර රත්නායක සොහොයුරත්, ඉරේෂා සොහොයුරියත්, මුද්‍රණ කටයුතු සිදුකළ බදුල්ල සී.ටී.අයි ප්‍රින්ටර්ස් අධිපති අශෝක මහතාත් ස්තුති පූර්වකව සිහිපත් කරමි.

පහේ ශිෂ්‍යත්වයෙන් සමත්ව මාගේ හෙට දවස පිළිබඳව ඉවෙන් අවබොධ කොටගෙන මාවතක් විවර කර දී අදත් ඒ දෙස ආදරයෙන් බලා සිටින මාගේ ආදරණීය අම්මාත්, තාත්තාත් මාගේ මෙම ප්‍රයත්නයේ දි ඉහළින්ම ගරු බුහුමනට ලක් වන්නේ බැති සිතිනි. මාගේ උසස් අධ්‍යාපන කටයුතු දක්වා සියළු අවශ්‍යතා සොයා බලා අදටත් මවක් මෙන් අප ගැන සොයා බලා කටයුතු කරන පොඩි අක්කාත්, ගාමිණී අයියාත් ඇතුළු මාගේ සියළුම සහෝදර සහෝදරියනුත් හද බැතියෙන් සිහිපත් කරන්නෙමි. කුඩා කාලයේ සිටම නැටුම්

පිළිබඳව මා තුළ තිබූ සිහිනය සැබෑ කරමින් නිවැරදි ගුරුවරුන් යටතට මා යොමු කරමින් විශ්වවිද්‍යාලීය කටයුතු සඳහා මුළු හදින්ම මා හට උපකාර කළ මාමා ද හද බැතින් සිහිපත් කරමි.

එපමණක් නොව මාගේ ආදරණීය සැමියාගේ මවත්, පියාත් මේ පර්යේෂණයේ නිරතවන කාලය තුළ මාව ඉවසමින්, ධෛර්යමත් කරමින්, ඉඩ හසර ලබා දී සිදු කලා වූ මෙහෙය පිළිබඳව මාගේ හද පිරි ස්තුතිය පුද කරමි.

මෙහිදී විශේෂයෙන් සිහිපත් කළ යුත්තෙකු සිටී. එනම් මාගේ පර්යෙෂණ කටයුතු ආරම්භ කළ දිනයේ සිට මාගේ සෙවණැල්ල මෙන් මා පසු පස එමින්, සකල විධ දුක් විඳමින්, අදත්, හෙටත්, මා දිරිමත් කරන ආදරණීය ස්වාමි පුරුෂයා වන නිලන්ත රත්නායක මහතා සිහිපත් කරන්නේ ආදරයෙනි.

# හැඳින්වීම

ප්‍රාග් ඓතිහාසික යුගයේ පටන්ම මානවයාගේ අධ්‍යාත්මය සමඟ බද්ධ වූ ඇදහිලි විශ්වාස හා නොයෙකුත් පූජා විධි පැවති බව නූතන පර්යේෂණ හරහා තහවුරු වී ඇත. වර්තමානයේදී ක්‍රියාත්මක වන ආකාරයට දියුණු ආගමික සංකල්ප හා අතීත ඇදහීම් ක්‍රම තුළ අන්තර්ගත වූ බවට සාක්ෂි නොලැබෙන නමුත් දිගු කාලයක් තිස්සේ පැවත එන විශ්වාසයන්හි ප්‍රතිඵලයක් වශයෙන් දියුණු දෙවි දේවතාවුන් පිළිබඳ වන්දනීය ක්‍රම බිහි වී ඇත. බොහෝ සංස්කෘතීන් සමග අනුබද්ධ වූ මෙම දේවතා සංකල්පය වර්තමානයේදී වඩාත් සක්‍රිය ලෙසින් ක්‍රියාත්මක වීමේ පදනම අතීත සංසිද්ධීන් සමඟ අනුරූප වේ.

ක්‍රි:පූ යුගයේ ආර්‍යයන්ගේ ආගමනයට ද පූර්ව ලක්දිව ක්‍රියාත්මක වූ දේව ඇදහිලි හා විශ්වාස පිළිබඳ දීප වංශය, මහා වංශය ප්‍රමුඛ ප්‍රධාන මූලාශ්‍රයන් කිහිපයකම සඳහන් ය. ශ්‍රී ලාංකික සමාජය බෞද්ධාගමික පසුබිමක් තුළ සංධාන ගත වීම ක්‍රි:පූ 3 වන සියවසින් පසුව ක්‍රමිකව විකාශය වුවත් ඉන්දියානු ආභාසය හරහා විවිධාංගීකරණය වූ සංස්කෘතිකාංග දක්නට ලැබුණි. මුල් අවස්ථාවේ හින්දු ආගමික බලපෑම් ඔස්සේ ලාංකේය දෙවිවරු කිහිප දෙනෙකුට සීමා වුවත්, පසු කාලීනව විවිධ අවශ්‍යතාවයන් හා ආභාසයන් මත දෙවියන් ඇදහීමේ ක්‍රමය ද ඉන්දියානු සාගරය තරණය කොට පැමිණ බව වර්තමාන අධ්‍යයන, පර්යේෂණ මගින් තහවුරු වී ඇත. මෙයින් එක් ප්‍රවණතාවක් ලෙස ''ආලත්ති පූජාව'' ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත විය. ඉපැරණි යුගයේ පටන්ම රාජකීය අවශ්‍යතාවයන් හා ආගමික පසුබිම තුළ වර්තමානය දක්වා විකාශය වෙමින් දේශීය අගමික පසුබිමෙහි සංස්ථාගතවූ මෙකී ''ආලත්ති පූජාව'' ''ආලත්ති අම්මාවරුන් විසින් දෙවියන් උදෙසා සිදු කරනු ලබන්නකි'' . දේව කාර්‍යයෙහි ඉතා සුවිශේෂී වූ කාර්යයක නියැලී සිටිමින් දෙවියන් පිනවන ''ආලත්ති අම්මාවරුන්ගේ සමාජභූමිකාව'' පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක් මෙම නිබන්ධය මගින් ඉදිරිපත් කිරීම මාගේ ප්‍රධාන අරමුණ යි.

## අධ්‍යයනයේ අරමුණ හා වැදගත්කම

විවිධ දෙවි දේවතාවන් උදෙසා පූජා විධි රාශියක් දක්නට ලැබෙන අතර, එකී චාරිත්‍ර විධි ඉටු කරන නිලමඩුල්ලක් ඒ ඒ දේවාල කාර්ය සඳහා ඇප කැපවී සිටිති. එහිදී දේවදාසීන් මෙන්ම ආලත්ති අම්මාවරුන්ට ද විශේෂ තැනක් හිමිවේ. එහෙත් ආලත්ති පූජාවෙහි යෙදී සිටින ආලත්ති අම්මලාගේ දායකත්වය දේව කාර්යය සඳහා අත්‍යවශ්‍ය හා අනිවාර්ය අංගයක් වුවද ඔවුනගේ සමාජ භූමිකාව පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක් මෙතෙක් ඉදිරිපත් කර නොමැත. එම නිසා මෙම පර්යේෂණ මාතෘකාව මෙතෙක් උගතුන්ගේ අවධානයට එතරම් යොමු නොවුණු අංශයක් පිළිබඳව සැකසුනක් බව හැඳින්විය හැකිය. මෙම පර්යේෂණ මාතෘකාව සම්බන්ධයෙන් මා විසින් කරන ලද ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී ආලත්ති අම්මාවරුන් සහ ඔවුන්ගේ කාර්ය භාරයෙහි වැදගත්කම මෙන්ම එහි ඉපැරණි බව හෙළිකරන බොහෝ සාධක හඳුනාගත හැකි වීම ද මෙම මාතෘකාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට හේතු විය. එවැනි සාධක මගින් දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන ආලත්ති අම්මාවරුන්ගේ දායකත්වය අතීතයේ සිට මේ දක්වා ලැබී ඇති බවත්, දේව පූජාව උදෙසා ඔවුන්ගේ මූලිකත්වය අත්‍යවශ්‍ය බවත් පැහැදලිව පෙනෙන හෙයින් මෙවැනි අධ්‍යයනයක් කිරීම වඩාත් උචිත බව මාගේ හැඟීමයි.

ඉපැරණි යුගයේ සිට දෙවියන් හා රජවරුන් පිනවීමේ කාර්යයෙහි යෙදී සිටි ආලත්ති අම්මාවරුන්ගේ සමාජ භූමිකාව පිළිබඳ පුළුල් අවබෝධයක් ලබාගැනීමට ඉවහල් කරගත හැකි කරුණු බොහෝ වෙත්. ඒවා පිළිබඳ ගවේෂණාත්මක අධ්‍යයනයක් මෙමගින් ඉදිරිපත් කිරීම ද මෙහිලා අපේක්ෂා කෙරේ. ඒ අනුව මෙතෙක් නිරාවරණය නොවූ, නමුත් දේව පූජා විධීන් අතර සුවිශේෂී අංගයක් වන ආලත්ති පූජාව සහ ආලත්ති අම්මාගේ කාර්යභාරය කෙතරම් වැදගත් ද යන්න මෙම අධ්‍යයනයෙන් පැහැදිලි කරගත හැකි ය.

### අධ්‍යයන සීමාව

දැනට ලංකාවෙහි ආලත්ති පූජාව සිදු කෙරෙන ප්‍රධාන පූජනීය ස්ථානයන් වශයෙන් සැලකෙන කතරගම, සබරගමුව, සොරගුණේ, ශ්‍රී දළදා මාලිගාව හා සම්බන්ධ ආලත්ති අම්මාවරු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කොට විෂය ක්ෂේත්‍රය සීමා කර ගැනීමෙන් අධ්‍යයනය කිරීමට අපේක්ෂිත යි.

## අධ්‍යයන ක්‍රමවේදය

01. මූලාශ්‍ර පරිශීලනය.

- ප්‍රාථමික මූලාශ්‍ර
- ද්විතීයික මූලාශ්‍ර
- වාර සඟරා
- විද්‍යුත් සන්නිවේදන මාධ්‍යය

02. සම්මුඛ සාකච්ඡා

# අධ්‍යයන සැලැස්ම

## පළමු වැනි පරිච්ඡේදය

01. ආලත්ති යන වචනය පිළිබඳ නිර්වචන

## දෙවැනි පරිච්ඡේදය

02. දේව සංකල්පය, දේවදාසින් හා ආලත්ති අම්මාවරු

2.1 දේව සංකල්පයේ ආරම්භය

2.2 දේව සංකල්පයේ බෞද්ධ පසුබිම

2.3 දේව සංකල්පය හා දේවදාසීන්

2.3.1 දේවදාසීන් (හැඳින්වීම)

2.3.2 පෞරාණික හා මධ්‍යකාලීන ඉතිහාසය

2.3.3 වර්තමාන තත්ත්වය

## තෙවැනි පරිච්ඡේදය

03. දේශීය දේවාල සංස්කෘතිය හා ආලත්ති අම්මාවරු

3.1 කතරගම දේවාලය හා ආලත්ති අම්මාවරු

3.2 දළදා මාලිගාව හා ආලත්ති අම්මාවරු

3.3 සබරගමුව මහ සමන් දේවාලය හා ආලත්ති අම්මාවරු

3.4 සොරගුණේ දේවාලය හා ආලත්ති අම්මාවරු

## සිව් වැනි පරිච්ජදය

04. ආලත්ති අම්මාවරුන්ගේ සමාජ භූමිකාව

**පස් වැනි පරිච්ඡේදය**

05. සමාලෝචනය

ආශ්‍රිත ග්‍රන්ත නාමාවලිය

සූචිය

ඡායාරූපාවලිය